රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/94

මගේ අංකය: III/0266/2/68(පොදුඑල්)එච්ජ්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 ජනවාරි 31 දින.

සියළුම ලේකම්වරුන් සහ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ආයතන සංග්‍රහය - **XXIV** වැනි පරිච්ඡේදය - වැටුප් ණය

1991.04.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 11/91 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

**02.** එම චක්‍රලේඛයේ **03** වන වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබන අතර, ඒ අනුව ආයතන සංගහයේ XXIV වන පරිච්ඡේදයේ 8:1 උපවගන්තිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.11/91 නිකුත් කිරීමට පෙර පැවති ආකාරයට නොවෙනස්ව පවතී. (මේ අනුව තම රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මෝටර් සයිකලයක්/ස්කූටරයක් තබා ගැනීම අත්‍යවශ්‍ය, ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකුට හෝ තාවකාලික නිලධාරියෙකුට පමණක් ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය)

**03.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සටහන :-

මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා තාවකාලික නිලධාරියෙකු යනු අදළ ණය මුදල අය කර ගැනීමට නියමිත කාල සීමාව තුල සේවයේ යොදවා ගැනීමට අවකාශ ඇති තාවකාලික නිලධාරියෙකි.